## සිහිනයක්



පුළුල් පපුතුරෙහි ඔබෙ
මගේ හිස හොවා ගෙන
හිතේ දුක නිවෙන තුරු
අඬන්නට හිතයි මට

හදේ ගැඹුරුම තැනින්
පිටව එන සුසුම් ගෙන
ඔබේ දෙකොපුල් පුරා
තවරන්න හිතයි මට

මගේ කඳුළැලි පිසින
ඔබේ දෙනයන තුළට
ආදරෙන් ළං වෙලා
මුමුණන්න හිතයි මට

ජීවිතේ බර දරන්
ඔබේ සෙවනැල්ල යට
නිමාවන තුරු සසර
සරන්නට හිතයි මට

**මේනකා ජයතිලක**
ක්වීන්ස්ලන්තය

සිතුවම්
**පුණ්‍යා මුණසිංහ**

## දයාබර නැගණියේ

| | |
|---|---|
| නැත ලොවේ මෑණියන් සිහිවටන | වැලක්මය |
| පියා පැතු අන් ලොවද, අප නොපැතූ | ලොවක්මය |
| සිතූ පැතු සියළු දේ පලා යනු | පවක්මය |
| කෙසේ වෙද, අප උරුමෙ දැනෙන්නේ | දුකක්මය |
| හිරු සඳුද නැති ලොවේ උඹට රැස් | දකින්නට |
| වෙර දරමි තරු කැටක් පමණ හෝ | පෙනෙන්නට |
| සුවඳ දෙන රෝස මල් පියලි මත | තබන්නට |
| බැහැ නගේ සැනසියන් උරුම දේ | ලබන්නට |
| අළුයමේ හෙට දිනේ කිරි ගසක | පාමුලදී |
| වතුසුද්ද මල් වතුර දෝවන්න | නැකතේදි |
| මවක් නැහැ පතනනට පා වදින | මොහොතේදි |
| නැගණියේ නාඩන්න පතිනි දෙවි | පිහිටේදි |
| අරුණැල්ල මිහිකතට සිපගන්න එන්න | පෙර |
| පසෙකලූ නින්ද මට බල කරයි, නගා | සැර |
| වරිච්චියෙ මුල්ලකට කඩමාළු මගෙගග | පැදුර |
| සොයන්නම් සොච්චමක් උර මතින් හෙලා | බර |
| දෑත රැළුවුණ, ගත වෙහෙසවුනි බලා | කහවනුවක් |
| එපා මා කුස හඬ තලන්නට අද දිනේ | පමණක් |
| දොතොල දක්නට අෑ එතේ මුදු සිහින් | හසරැල්ලක් |
| සිනිඳු කන්පෙති සරසවන්නට, ගන්න රන් මිණි | තෝඩුවක් |

**ධර්ම කේ. කොඩිප්පිලි**

## තේ දළු නෙලන්නිය

| | |
|---|---|
| සැවුලන් හඬ ලද්දි සැනෙකින් | පිබිදීලා |
| ගෙහි දොර සියලු වැඩ කටයුතු නිම | කරලා |
| තේ උගුරකින් දිව කටගත | පිනවාලා |
| සංගුව පිඹින්නට පෙර යයි වත්ත | බලා |
| මීදුම ගලා එන විට කඳු වැටී | මැද්දෙන් |
| හිරිගඬු පිපෙන ශීතල පවනට | අස්සෙන් |
| පිණිබිඳු පිරුන නිල් තණ කොළ ගොමු | අතරෙන් |
| ජීවිත ගැට ගසන්නට යයි තේ | දල්ලෙන් |
| අවු වැසි නොබලමින් දහඩිය වගුර | වෙමින් |
| තේ ගස් සමඟ පොර බදිමින් වෙහෙස | වෙමින් |
| රතැඟිලි වලින් ලා දලු පත් නෙලා | සෙමින් |
| පිට බත තිබෙන කූඩෙයට දලු දමයි | සෙමින් |
| ජාතික ධනය තර කෙරුමට දෙනව | අත |
| නෙලනා දහඩියට සරිලන වැටුප | නැත |
| වෘත්තිය තුළින් තෘප්තිය නොලැබෙනවා | ඇත |
| සාධාරණව පැනයට විසඳුමක් | නැත |
| දනපති පංතියේ ලොකු අය විඳින | සැප |
| පීඩිත පංතියේ අපහට නොලැබ | සැප |
| සේවය කරනමුත් අප ජීවිතය | කැප |
| කවදා අපට හිමිවේවිද එවැනි | සැප |

**එස් රත්නායක**
Clayton




## අහිමි ප්‍රේමය

සාද තෙපුල් මැද විසල් විමානේ
උයන් කොනේ සිත අනන්තයේ
කවි නළු ගී මැද සතුටු සාගරේ
හදවත ගොළු වී නිරන්තරේ....

ඉර හඳ දියුරා එක් තැන් කල සිත
පෙම් බස් දෙඩුවා සයුරු තෙරේ
කුරුටු ගීත ලිව්වා සිය දහසක්
ඔබෙත් මගෙත් සිත් පවුරු කොනේ.....

සිය දහසක් එළි විදුලි බුබුලු මැද
පෙරදා පෙම්කල කුමාරියේ
අඳුරට පෙම්බැන්දා මා තනියට
හිරු නැති සඳු නැති විමානයේ.....

**පුෂ්පිකා ගමගේ**
රොස්බර්ග් පාක්

## ''මා බාල කාලේ''

| | |
|---|---|
| හැදුවෙමි ගනන් දු සමඟින් | හැමදාම |
| ලිවෙමි කවි රචනා කවි පෙල | සේම |
| සිහිවෙනවා පාසැල් කාලය පෙර | සේම |
| මගේ සිත ඉගිලී යයි පාසැල | වෙතම |
| කරමි සෙල්ලම් දැල් පන්දු ද දූ | සමගින |
| නැටුවෙමි ගැයුවෙමි දු සමඟින් | සතුටින |
| කරනා තුරු මේ දේවල දූ | සමඟින් |
| සිහිවෙයි පාසැල් කාලය | නිතැතින |
| කෙලි සෙල්ලම් කරන | කලට |
| සිහිවෙනවා පාසැල මගේ | හිතට |
| යන්නට ඇත්නම් පාසැල | වෙතට |
| දුව යමි මම මගේ විදු | බිමට |

**සිදා මාටින්ස්ටයින්**

## අටමස්ථානේ...

අටමස්ථානේ වඳින්න පිං කරළා නෑ... පුතේ
සාදු කාරේ ගිගුම් දෙන්න මම වැඳලා නෑ ..... පුතේ
මං මැරෙනන පළමු වෙන්ම එක්කන් යනවද පුතේ
අටමස්ථානේ වඳින්න පිං කරළා නෑ පුතේ

නෙළුම් මලේ සුවඳ තිබුණේ හිත ඇතුලෙයි මගේ පුතේ
ඒ සුවඳට ඔබේ සුවඳත් මුසු වීලා මට දැනේ....
''සද්ධාවේ'' පරම පැතුම හරි මිහිරියි ලොකු පුතේ....
අටමස්ථානේ වඳින්න එක්කන් යනවද පුතේ...

පවුල අවුල් කරගෙන සළකන්න එපා ලොකු පුතේ
අටමස්ථානේ නොගියට මම තරහාක් නෑ හිතේ.....
''සද්ධාවේ'' පරම පැතුම හරි මිහිරියි ලොකු පුතේ.....
අටමස්ථානේ වඳින්න පිංකරළා නෑ... පුතේ

**නිලාන් මාගම්පිටිය**

## අසම්මතය

පැටලුනත් නෙත්සර
නුඹේ සහ මගේ
කොහොමද නවතින්නෙ
අසම්මත ඉමේ
වදන් කරනට කිසිදිනෙක
අයිතියක් නැති ලොවේ
මියෙනතුරු සඟවගමු
මේ සෙනෙහස හදවත කොනේ

ඔබට මා මටද ඔබ
හිමිනොවන බව කිසි ලෙසේ
පිළිනොගන්නා සිතට
කියාදෙන්නේ කෙසේ
හමුවෙලා වෙන්වන්නට පමණයි උරුම
සෙනෙහසට අපේ
හිත හදාගෙන හිඳිමු
හමුවනතුරා අන් අත්භවේ

නුඹේ නෙත් පහසට
පිබිදුනත් සිත මගේ
මේ කඩඉම් බිඳඑන්ට
මගෙ සිතට දිරි නොවේ
අසම්මතයෙන් බැඳී
ලබන්නට ගැරහුම් ලොවේ
යළිත් හෙට හමුනොවේ
සමුදෙන්න අද දිනේ.....

**චාන්දනී කුලතුංග**
නවසීලන්තය

## ඉද්ද මල



වැඩිවිය පැමිණිදා මුණ බැලු හැටි මතකයි
වතුර බේසමකින් ඉද්ද මල් සහිත.
ඉද්ද මල කියා පෑවේ
යුවතියක වැඩිය යුතු යහගුණ.

චාම් බව හා පිවිතුරු කම මෙන්ම
අච්ච වැස්සට ඔරොත්තු දෙන ගතියද
නොඅඩුව පිහිටා තිබුණා
ඉද්ද මල තුල.

එකින් එක පෙති හැලුනත් - විසිතුරු රෝස මල්වල
පෙති පහ එකටමයි චාම් ඉද්ද මලේ
මරණය දක්වා හෙළ කත රකින
හිමි, දරු, දෙගුරු, සොයුරු බැමි මෙන්ම.

★★★

ජීවිතය පුරා ලෙන්ගතුව සිටි
නෑයෙකු දුටුවා වගෙයි
ඉද්ද පැලයක් මෙල්බර්න් ආවිට
ඩාවින් නුවර සිට.

ලැව්ගිනි දූමාරෙන් නගරයම කළුවුණ
උදුවප් මහේ දවසක
පිපුණි පළමු ඉද්ද මල
සුදුම සුදු පාටින් පිවිතුරුව.

දූෂිත පරිසරය මැද
විකල් කර නොගත් සිය හිස
හෙළ කුල කතක් හිනැහෙනු වැනිය
මගේ බැල්කනිය මත!

උදෑසන නැගෙන විට නිදි ඇදෙන්
මගේ නෙත පිනන පිය දසුන !
පුදුමයි පුංචි ඉද්ද මලක්
මේ තරම් සතුටක් ගෙනා හැටි -- හිතකට !!

**ශ්‍රියානි පෙරේරා**
සවුත්බෑන්ක්

## හැකිවේවිද මට

**නිලම්බරේ ගැහී දිලෙන,**
**එකම පුංචි තාරකාව**
**අඳුර මැදින් දිලුලමින්**
**වරෙක දැවෙමින් - නිවෙමින්**
**පවසන්නේ ජීවිතයක ඇති**
**අසුන්දර අනියතට නේද?**

**අඩපණ වී ඇති ජීවිත**
**සුසුම් හෙළනා ජීවිත,**
**සුන්දරත්වයේ මතක සටහනින්,**
**හදවත් මඩල දවාලමින්**
**රඟහලක අස්ථිර බව**
**දැන දැන රඟපාමින් රැගුමන්**
**ඇලී ගැලී නිවට ලෙසින්,**
**සසර කතරේ රැදෙමින්**
**විඳවන්නේ**
**කම් සැපට නොවේද?**

**පිණිබිඳු වැනි ආත්මයක,**
**කර පින්නා බැඳි කරදර**
**දිවි ගමනේ මිලාන බව,**
**මතකයේ මනසට දුවද්දී**
**වේදනාවේ කටුක බව**
**නොමදන්නේ අපම නේද?**

**සසරෙ බැඳි බැමි අත්හැර**
**අනියත බව අමතක කර**
**විඳි සුබ විහරණ නොතකා දිනයක,**
**මතු ආත්මයේ දල්වන්නට හද**
**ථෙරී ගාථාවක් ගැයුමට,**
**කහ සිවුරක් දෝතින් ගෙන,**
**කෙළෙසුන පරදා ජයගෙන**
**ප්‍රඥා නැණ දල්වන්නට**
**කෙදිනක හැකිවේවිද මට?**

**කාන්ති වික්‍රමසූරිය**
**ලංකාවේදී**

## කුමර කුමරි වත



කුමාරිකාවක් සඳළුතලෙන් බැස
ලාලිත ගමනින් දොරට වඩී
අහස් නැවක් බොර වතුර කපා විත්
දොරටුව අබියස බලා හිඳී

කුමර කුමරි මිණි කිකිණි සිනා හඬ
රිය සක අතරින් පෙරට ඇදී
ඇත් දල ගෙල මුතු මාල අරුංගල්
වැසි දිය මත දේදුනු පළදී

බැද්දෙ ඉමේ මැටි පැලක කවුළුවෙන්
එබෙන සඳක තරු මල් බැබලී
නෙත වැලපෙද්දී හිත හිනැහේවී
හීන දකින්නට වරම් ලැබී

**ශ්‍රියා කුමාරසිංහ**
නවසීලන්තය

සාහිත්‍යයට පෙම් බඳින නිර්මාණකරුවනි නිර්මාණකාරියනි www.ketapathpawra.com වෙබ් අඩවියට ගොඩවෙන්න අමතක නොකරන්න